## කැබිනට් පත්‍රිකාවෙන් විකිණෙන සමුපකාර පද්ධතිය

2023/08/24 දාතම සහිත වෙළඳ හා වාණිජ අමාත්‍ය වරයා විසින් සමුපකාර ප්‍රතිව්‍යුහගත කිරීමට මුවාවෙමින් ශ්‍රී ලංකාවේ සමස්ත සමුපකාර පද්දතියම විකිණීම සඳහා කැබිනට් පත්‍රිකාවක් නිකුත්කර ඇත. ඒ සඳහා කැබිනට් අනුමැතිය ලබාගෙන ඇත.

ඒ පිලිබඳව නිර්දේශ ඉදිපත් කිරීම සඳහාද ජනාධිපති වරයාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍ය මණ්ඩල අනු කමිටුවක් පත්කොට නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ද නියෝග ලබාගෙන, මේ වන විටත් එම නියෝගය ක්‍රියාත්මක කිරීම ආරම්භකර ඇති බවත් ඔබ දන්නවාද?

සමුපකාර පද්දතිය යනු සාමාජිකයා සතු, සාමාජිකයා විසින් පාලනය කරනු ලබන සමාජ ව්‍යවසායකි. සමුපකාරය සතුව පවතින්නේ සාමාජිකයා සතු මුදල් වේ. එම මුදල් හා වත්කම් පරිපාලනය කිරීම සඳහා සාමාජිකයා විසින්ම අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගන්නා අතර, එම පද්ධතියට අත ගැසීමට කිසිඳු බලයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ සමුපකාර පනතෙන් ඇමතිවරුන්හට ලබා දී නොමැත. එය ජාත්‍යන්තර සමුපකාර නීතියයි.

**කැබිනට් පත්‍රිකාවක් හරහා සමුපකාර පනතේ බලතල අභිභවා යමින්, සමුපකාරිකයා සතු අධ්‍යාපන මහ ගෙදර ප්‍රමුඛ ආයතන විකිණීම හෝ, සමුපකාරය ප්‍රතිව්‍යුහ ගත කිරීම මුවාවෙන් සමුපකාරය සතු දේපල පෞද්ගලීකරණය කිරීම විකිණීම හෝ කිසුඳු ව්‍යුහාත්මක වෙනසක් කිරීමට කිසිඳු ඇමතිවරයෙකුට හෝ බලයේ සිටින දේශපාලන පක්ෂයකට බලතල නොමැත.**

එසේ ව්‍යුහාත්මක වෙනසක් කරන්නේ නම් එය කල හැක්කේ 1972 අංක 5 දරන සමුපකාර පනත සංශෝධනය කිරීමෙන් පසුව පමණි. තවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව කටයුතු කරන බව පවසමින් මෙම ව්‍යුහාත්මක වෙනස කිරීමට සැරසේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මුදල් කළමනාකරණ ප්‍රතිපත්ති හැදීම හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුව යටතේ පවතී. තවද සියලු පළාත් ප්‍රඥප්ති නිර්මාණය කොට ක්‍රියාත්මක කරන තෙක් සම්පූර්ණයෙන්ම වලංගු වන්නේ දැනට පවතින පනත බව ඔබ දන්නවාද? තවමත් පළාත් 4ක ප්‍රඥාප්ති නිර්මාණය කොට නැත. එබැවින් පනත නිශේධනය කොට හා එය අභිබවා කටයුතු කිරීමට මේ අවස්ථාවේ කිසිසේත්ම නෛතික හැකියාවක් නැත.

අද සමුපකාර ව්‍යාපාරය මුලුමුනිම ආරක්ෂිතව පවතින්නේ රේඛිය සමුපකාර දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන සමුපකාර පනත හරහාය. කැබිනට් පත්‍රිකාවක් හරහා රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුව වසා දැමීමට හෝ එම දෙපාර්තමේන්තුව අමාත්‍යවරයා යටතට ගැනීමට ඇමතිවරයෙකුට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කිසිඳු බලයක් ලබා දී නොමැත. මොවුන් කිරීමට සැලසෙන්නේ රේඛීය දෙපාර්තමේන්තුව වසා දමා හෝ අකර්මන්‍ය කොට පනතේ බලතල සමුපකාරිකයාට අහිමි කිරීමයි. එසේ කොට සමුපකාරය අරාජික කිරීමයි.

ශ්‍රී ලංකාවේ මේ වනවිට පවතින හොඳම පනතක් ලෙස අධිකරණ කිහිපයකදීම ප්‍රසංසාවට ලක් වී ඇති පනතකි සමුපකාර ව්‍යාපාරය සතුව මේ වනවිට පවතින්නේ.

මෙම පනත ක්‍රියාත්මක වීම නිසා සමුපකාරිකයාට ඇති වාසි ගණනාවක් වන අතර ප්‍රධාන වාසි 3කක් පමණක් සඳහන් කරමු.

1. සමුපකාර මණ්ඩල 16ක් ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වීම සඳහා බලතල ලැබී තිබීම හරහා රටපුරා සියලුම් සමුපකාර සමිති එක ප්‍රතිපත්තියක ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබීම.
2. පළාත් මට්ටමේ සමුපකාර සමිති සඳහා නිවැරදිව මුදල් හා වත්කම් පාලනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය කොට ප්‍රඥප්ති හරහා ඒවා රටපුරා ඒකාකාරීව ක්‍රියාත්මක කිරීමට බලතල 13 වන සංශෝධනය හරහා ලැබී තිබීම.
3. ජාතික මට්ටමෙන් සමුපකාර සමිති 56 ක්‍රියාත්මක වීම නිසා එම සමිති වල ප්‍රාග්ධනය ඉහල මට්ටමක පවත්වාගැනීමට හැකියාව ලැබේ. එබැවින් එම සමිති වල විශාල මුදල් තැන්පත් ප්‍රමාණයක් ඇති අතර සාමාජිකයාට විශාල ප්‍රමාන වලින් ණය හා සහන ලබා දීමේ හැකියාව පවතී

**උදාහරණයක් ලෙස:-**

අතිශය දුෂ්කර වනාතමුල්ල වැනි ප්‍රදේශයක ආරම්භ කරන ලද කාන්තා සමුපකාර සමිතියට එහි සාමාජිකයින්ට කිසිඳු ඇපයක් රහිතව රුපියල් ලක්ෂ 50 ක් දක්වා ණය පහසුකම් ලබා දීමට තරම් ප්‍රාග්ධනය සංචිතයක් ඇත්තේ ජාතික වශයෙන් සමුපකාර සමිති වලට ක්‍රියාත්මක වීමට අවස්තාව ඇති නිසාය.

මේ නිසා ම, මෙම ජාතික මට්ටමේ සමුපකාර සමිති වලට ජාතික වශයෙන් පවතින පෞද්ගලික සමාගම් හා කරට කර වෙළඳ ව්‍යාපාර කිරීමට තරම් ප්‍රාග්ධනය මෙන්ම, කළමනාකරණ හා පාලන හැකියාව ද තිබේ.

කැබිනට් පත්‍රිකාව හරහා සමුපකාර සමිති එක පළාතකට ගොනු කිරීමෙන් මෙසේ ජාතික මට්ටමෙන් ලියාපදිංචි කරන ලද පෞද්ගලික සමාගම් සමග කටයුතු කිරීමට ඇති හැකියාව අහිමි වනු ඇත.

**රේඛිය සමුපාර දෙපාර්තමේන්තුවක අවශ්‍යතාවය**

ඉහත කී කැබිනට් පත්‍රිකාව හරහා රේඛීය දෙපාර්තමේන්තුව අහෝසි කර හෝ ඇමතිවරයා යටතට පත්කොට දේශපාලනීකරණය කොට රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුව දියකර හැර ඇමතිවරයා යටතේ වැඩ කරන කොර්මසාරිස් වරයෙකුට පැවරීම තුළින්, සමුපකාර පද්දතියට ඇති ස්වාධීනත්වය විනාශ කර දැමීමට සැලසුම් කර ඇත.

සමුපකාර දෙපාර්තමේන්තුවට කොමසාරිස් වරයෙකු පත් කරනුයේ කැබිනට් මණ්ඩලය මගිනි. ඒ නිසා ඔහුට දේශපාලන බලපෑමට යටත් නොවී සමූපකාරිකයන් සමග වැඩ කිරීමට අවස්තාව සැලසේ.

බලයේ පවතින දේශපාලන පක්ෂයේ හා ආණ්ඩුවේ අනවශ්‍ය බලපෑම් වලින් තොරව සමුපකාරය පවත්වා ගැනීම සඳහා, කොමසාරිස් වරයාට පූර්ණ බලතල 1972 අංක 5 දරන පනතින් ලබා දී ඇති අතර ඇමතිවරයා සතු බලතල අවම කර ඇත. ඇත්ත වශයෙන් කිවහොත් ලොව පවතින ස්වාධීනතම ආයතනය සමුපකාරයයි. එහි ඇත්තේ රජය මගින් ලබා දෙන මුදල් නොව සාමාජිකයා සතෙන් සතේ එක්රැස් කර පරිස්සමින් පාලනය කරන මුදල්වේ. එම මුදල් පාලනය කිරීම වසර 116 කට අධික ඉතිහාසය තුල සාර්ථකව සාමාජිකයා විසින් කර ඇත. ඒ සාමාජිකයා පාලනය කරන්නේ සාමාජිකයාගේ මුදල් බැවිනි. මෙම මුදල් අයතා පරිහරණය නතර කිරීමට එම මුදල් හා වත්කම් පොදු දේපල පනත යටතේ පොදු දේපලක් බවට පත් කර තිබීම විශේෂ ලක්ෂණයකි. එබැවින් එම වත්කම් පරිපාලනය කිරීමට නියාමනයක් අවශ්‍ය නොවන තරම්ය. මන්ද යත් යමෙක් සමුපකාර දේපල අයතා පරිහරණය කිරීම ඇප නොමැතිව සිරගත කිරීමට තරම් ප්‍රබලය. එබැවින් පසුගිය වසර 116ක කාලය තුලම සිදුවී ඇති මුදල් අයතා පරිහරණ සිවිල් නීතිය යටතේ හා මහබැංකුවේ නියාමනය යටතේ පවතින පෞද්ගලික මූල්‍ය ආයතන වල සිදුවී ඇති මුදල් අයතා පරිහරණය මෙන් මෙන් 1/10 කටත් අඩු ප්‍රමාණයකි.

උදාහරණයක් ලෙස පසුගිය වසර 20 තුල මහබැංකුවේ නියාමනය යටතේ පවතින මූල්‍ය ආයතන 30කින් 7ක් කඩා වැටී ඇති අතර මහජනයාට ගෙවීමට ඇති මුදල රුපියල් බිලියන 70ක් පමණ වන බව ගණන් බලා ඇති අතර සමුපකාර පද්දතිය පසුගිය වසර 116කටත් වැඩි අතීතය තුල විවිධසේවා සමුපකාර සමිති හා බැංකු 14000ක් කින් සාපේක්ෂව කිහිපයක් පමණක් කඩා වැටී ඇති අතර, එනිසා සමුපකාර සාමාජිකයාට ගෙවීමට සිදුවූ මුදල රුපියල් බිලියන 7කටත් අඩු මුදලකි. තවද විශේෂත්වයක් වන්නේ සමුපකාර පද්දතිය තුල යම්කිසි සමුපකාර සමිතියක් කඩා වැටුන විට අධිකරණ ක්‍රියාමාර්ගයන්ගෙන් පසු එහි වත්කම් ද්‍රවශීලනය කොට සාමාජිකයාට මුළු තැන්පත් මුදලම ගෙවා දැමීමට කොමසාරිස්වරයාට බලයක් ඇත. ඒ සඳහා විශාල අරමුදලක් ද කොමසාරිස්වරයා සතුව ඇත. නමුත් මහබැංකුව හරහා නියාමනය කරන මූල්‍ය සමාගමක ඔබ මුදල් කෝටියක් තැන්පත් කලද එවැනි මූල්‍ය ආයතනයක් කඩා වැටුන විට ඔබට ලැබෙන උපරිම මුදල රුපියල් ලක්ෂ පහක් පමණක් බව ඔබ දන්නවාද? එම ලක්ෂ 5 වත් පසුගිය සමයේ කඩා වැටුන මූල්‍ය සමාගම්වල තැන්පත් කරුවනට මහබැංකුව විසින් නොගෙවූ බවත් ඔබ දන්නවාද?

සමුපකාර සම්ප්‍රදාය වසර 116 කට වැඩි කාලයක් පැවතීම නිසා අදටත් විශාල සමුපකාර පද්දතියක් ශ්‍රී ලංකාව තුල තිබේ. මෙම සමුපකාර පද්දතිය කෙතරම් ශක්තිමත් ද යන්න පසුගිය අඳුරු යුගයේදී හොඳින් දැක ගන්නට ලැබුනි.

ඇමරිකාව වැනි රටවල උද්ධමනය 2%කින් වැඩිවෙද්දී පාරක් පාරක් ගානේ නිවාස රහිතව (හෝම්ලස්) මහජනතාව පෙලගැසෙත්දී, ශ්‍රී ලංකාවේ 50%ක් දකවා උද්ධමනය වැඩි වුවද එකඳු ශ්‍රීලාංකිකයෙකු හෝ නිවෙස් රහිත (හෝම්ලස්) පුද්ගලියන් ලෙස මහපාරවල් වල දැකීමට නොහැකි වූයේ සමුපකාර පද්දතියේ ඇති ප්‍රබල බව නිසාය.

කවුරු කෙසේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය ගැන කතා කලද, සමුපකාර හරහා පෝෂණය වී ඇති ප්‍රබල ග්‍රාමීය ආර්ථිකයක් ශ්‍රී ලංකාව සතුවේ. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආර්ථිකයෙන් මුදල් සංසරණයෙන් 80% ක් කළමනාකරණය කෙරෙන්නේ සමුපකාරය හරහා මිස මහබැංකුව යටතේ පවතින වාණිජ බැංකු හරහා නොවේ. රටක ආර්ථිකය දුර්වල කොට ණය

උගුල්වල පැටලවීමට මාන බලමින් සිටින IMF ආයතනය ලෝක බැංකුව වැනි ආයතන වලට ඇති අභියෝගය ශ්‍රී ලංකාවේ සමුපකාරයයි. රටේ ආර්ථිකය දුර්වල කොට ණය ලබා දී ණය කොන්දේසි හරහා රට ඔවුන්ගේ ග්‍රහණයට ගැනීමට ඇති හැකියාව ශ්‍රී ලංකාවේ ප්‍රබල සමුපකාර පද්දතිය නිසා ඇහිරී තිබීම ඔවුනට ඇති ප්‍රධානම බඳාවයි.

සමුපකාරය දුර්වල කොට විනාශ කිරීමට සැරසෙන මෙම ජාත්‍යන්තර බලවේග සමග ශ්‍රී ලංකාවේ සමහර සමුපකාර නායකයින්ද අත්වැල් බැඳගෙන කටයුතු කිරීම අතිශයින් කනගාටුවට කාරණයකි. මෙම විනාශය වසරකට වැඩි කාලයක් පුරාවට දැක දැකත් මේ වනතෙක් ම කිසිඳු ක්‍රියාමාර්ගයක් නොගෙන කටයුතු කරන සමුපකාරය නායකයින්ට අප කියා සිටින්නේ දැන්වත් මෙම තත්වය තේරුම් ගෙන නිවැරදි මාර්ගයට යොමු වන ලෙසයි. ඔවුන් නිවැරදි මාර්ගයේ ගමන් ගන්නේ නම් ඔවුන් සමග අත්වැල් බැඳ ගැනීමට පහළ පෙලේ සමුපකාරිකයා සැම විටම ඉත සිතින් කැමැත්ත පල කර සිටී. එසේ නොකළහොත් ඔවුන් ගේ පැවැත්ම කෙටි කාලීන වනු ඇත. ප්‍රගතිශීලී නව සමුපකාරික ප්‍රජාවක් බිහිවන කාලය වැඩි ඈතක නොවනු ඇත.

**ශ්‍රී ලංකාවේ සමුපකාර පද්දතිය ජාතික මට්ටමේ සමුපකාර දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වීම නිසා විශාල වාසි රාශියක් සමුපකාරිකයා සතු වී තිබේ. ඉන් ප්‍රධාන කොට කිහිපයක් පහතින් දක්වමු.**

1. ක්‍රමානුකූලව සමුපකාර සමිති ලියාපදිංචිය සිදු කිරීම
2. සමුපකාර සඳහා රජයේ විගණනය නිසා සමුපකාර පද්දතියට ලැබී ඇත්තේ අතිශය ආරක්ශාවකි. අභිමානයකි. මහජන විශ්වාසයකි. මහජන පිළිගැනීමකි. අවසන් වශයෙන් ජාත්‍යන්තර පිළිගැනීමකි.
3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව සමුපකාර සඳහා මුදල් කටයුතු විගණනය පැවරී ඇත්තේ රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුවට වේ. එමගින් මුදල් විගණනය සඳහා ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කොට නිර්දේශ ඉදිරිපත් කොට පළාත් මට්ටමින් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා බලතල ලැබී ඇත.
4. සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට පුහුණු සමුපකාර නිලධාරීන් සහභාගී කරවීම තුල එම රැස්වීම් වල ගනු ලබන තීරණ පනතට රීතියට ව්‍යවස්ථාවට හා කාරක නියෝගවලට අනුගතව සිදු කිරීමට හැකියාව ලැබීම.
5. සමුපකාරයක් කඩාවැටෙන අවස්තාවකදී, එහි සාමාජිකයාගේ තැන්පතු නැවත ලබා දීම සඳහා, සමුපකාර අරමුදල හා වත්කම් ද්‍රවශීලනය කොට එම තැන්පත් සඳහා මුදල් ගෙවීමට රජයේ මැදිහත්වීම හරහා ක්‍රියාත්මක වීමට කොමසාරිස්වරයාට රාජ්‍ය බලතල ලැබී ඇත.

6. බේරුම්කරණය සඳහා රජයේ මැදිහත් වීම නිසා අධිකරණ කටයුතු පහසුවීම හා අධිකරණයට පිළිගත හැකි රාජ්‍ය මට්ටමේ තීරණ ලබා දීමට හැකියාව ඇත.

7. ජාතික මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යටිතල පහසුකම් උපදේශනය හා සහයෝගය දැක්වීමට බලතල ඇත.

8. සමුපාකාර අරමුදල පවත්වාගැනීම නිසා සමුපාරිකයාට ප්‍රාග්ධන අවශ්‍යතාවයන් සඳහා උදව් කිරීමට හැකියාව කොමසාරිස්වරයාට ඇත. ඇමතිවරයාට නැත.

**රේඛීය සමුපකාර දෙපාර්තමේන්තුව වසා දමා හෝ රේඛිය සමුපකාර දෙපාර්තමේන්තුව ඇමතිවරයා යටතට ගැනීමත්, පළාත් සමුපකාර කොමසාරිස්වරයා වෙනුවට ප්‍රාදේශීය ලේකම් වරයා පත්කිරීමත් නිසා සමුපකාර පද්දතිය කඩා වැටෙන ආකාරය.**

1. දැවැන්ත සමුපකාර අරමුදල හා සමුපකාරිකයා සතු බිලියන 550කට අධික මුල්‍යමය වත්කම පරිහරණය කිරීමට ඇමතිවරයාට අවස්තාව සැලසීම. (සමුපකාරිකයා සතු වූ මහජන බැංකුවට අත්වූ ඉරණම අධ්‍යනය කරන්න)

2. රේඛීය දෙපාර්තමේන්තුව අකර්මන්‍ය කිරීමෙන් පනතේ බලතල මුළුමුනින්ම අහෝසි වීම හා කිසිදු නියාමන මාර්ගෝපදේශනයක් කැබිනට් පත්‍රිකාවේ නොමැතිවීමත්,මෙම ව්‍යුහාත්මක වෙනස සිදු කිරීමට නව පනතක් ඉදිරිපත් නොකිරීමත් තුල කිසිඳු නීතියක් නොමැතිව සමුපකාර පද්දතිය අරාජික වීම.

3. සමුපකාර සාමාජිකත්වය මේ වනවිට 8,750,000 පමණ වන අතර, සමුපකාර සංගම් සමිති හා බැංකු ප්‍රමාණය 14,000ක් පමණ වන අතර, ඇමතිවරයා යටතේ තබාගන්නා කොමසාරිස්වරයෙකුට හා නිලධාරින් කිහිපදෙනේකුටත්, පළාත් මට්ටමෙන් ප්‍රාදේශීය ලේකම් වරයාටත් සමුපකාර පද්ධතිය නිසි විගණනයක් කිරීමට පිරිස් බලයක් නොමැති වීමෙන් සමුපකාරයට අවශ්‍ය දැනුම හා උපදේශනය නොමැතිවීම තුල සමුපකාර කඩා වැටීම.

4. පොල්ගොල්ල සමුපකාර විද්‍යාල භූමිය හා ගොඩනැගිලි ඇමතිගේ හිත මිතුරන්ට පවරා, සමූපකාරික අධ්‍යාපනය විනාශ කිරීමට සැළසුම් කර ඇත්තේ, ඒ මගින් ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට අනුව සමස්ත සමුපකාර ව්‍යාපාරය ම මරාදැමීමට හැකි වන බැවිණි.

**සමස්ත සමුපකාර පද්ධතිය ම මරාදැමීමේ අරමුණින් යුතුව නිකුත් කර ඇති මෙම අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව**

1. අමාත්‍යාංශ ලේකම් ප්‍රමුඛව නිලධාරීන් ඇමැතිවරයා ප්‍රමුඛ බලධාරීන්ට අවනිදේශනය කරමින් සම්පාදනය කර ඇත.
2. සමුපකාර පනතින් කවර ආකාරයෙන් හෝ පවරා නැති බලයක් ආරෝපණය කරගෙන අමාත්‍යවරයා සහ කැබිනට් මණ්ඩලය මෙම කැබිනට් පත්‍රිකාව අනුමත කර ඇත
3. අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර, අමාත්‍ය අනුකාරක සභාවක් විසින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇති මෙම කැබිනට් පත්‍රිකාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අනුල්ලංඝනීය ව්‍යවස්ථාවන් වන 1,3,9,10,11 යන ව්‍යවස්ථාවන් පහ ම උල්ලංඝනය කර ඇත.

4. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, අනුලංඝනීය නීති අතර අලුත් ගැටුමක් නිර්මාණය කරමින්, මේ මොහොත වන විට කැබිනට් මණ්ඩලය විසින් දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනයට නැති බලයක් ආරෝපණය කර ඇත.

මෙමන් නිසාන් සමුපකාරයන් ස්වාධීනත් කරගැනීමන් සනත් සටන් පාඨයට හා ඇමතිවරුන් දීන් ඇතින් "සමූපකාරය ස්වාධීන ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීම" යන රැවටිල්ලට හසුවී, ඒ සඳහාන් අත්‍යාවශ්‍ය නීති රීති අණ-පණත් සම්පාදනය කර ගැනීමෙන් තොරව, අදාළ යාන්ත්‍රණයන් ඉතාන් විධිමත්න් ව්න් පිහිටුවාන් ගැනීමෙන් හාන් ක්‍රියාත්මකන් කිරීමෙන් තොරව,න් පොල්ගොල්ලන් සමුපකාරන් මහගෙදර හා රේඛීය සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්න්ව විනාශ කිරීමට ඉඩදීම, හා පසුවන් පළාත දෙපාර්තමේන්න්ද අහෝසිකොට විනාශ කිරීමට ඉඩ දීම අපි ගසක අත්තක වාඩි වී එමන් අත්ත කපා දැමීමට ඉඩ දීම වැනි මෝඩ ක්‍රියාවකි.

පොල්ගොල්ල සමුපකාර විශ්ව විද්‍යාලය භූමිය විකිණීමට අර ඇදීම මෙම දැවැන්ත විකිණීමේන් මූලිකන් පියවරන් මණක්න් බවන් අපන් අවබෝධන් කර ගත යුන්ය. මීළඟට අරාජික වන ඔබ සමිතියන් නියාමනය මහබැංකුව යටතට පත්වන් ඇත. මුල්‍ය ආයතන 30 නිවැරදිව නියාමනය කිරීමටන් නොහැකි වූ මහබැංකුවට මේ සා විශාල පන්දතියක් නියාමනයට හැකියාවක් තිබේද? ඒ සඳහාන් සමුපකාර දෙපාර්තමේන්න්වට වසර 90කට වැඩි යාන්ත්‍රණයක් ඇත. තවද වඩා වැදගත්ම නේ සමුපකාරයන් නියාමනයටන් පොදුන් නේ පලන් පනතන් අතිශයින්මන් ප්‍රමාණවත්න් බවන් සමුපකාරිකයාන් හොඳින්ම දනී. එනම පනත යටතේ ස්වයන් නියාමනයක සමුපකාර පත්වනන් බැවින් පරිබාහිරන් නියාමනයක් අවශ්‍ය නොවන බව සියලු පාර්ශවයන් දැන ගත යුන්ය. සමුපකාර කොමසාරිස්න් වරයා හරහා කෙරන විගණනය සමුපකාරිකයාට අතිශයින් ප්‍රමාණවත්ය.

එමන් නිසාන් අපින් මෙමන් අවාසනාවන්තන් තත්වයෙන් සමුපකාරයත්,න් සමුපකාරිකන් ජනතාවත්න් ආරක්ෂා කර ගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි දැන්වත් කිරීම ආරම්භ කරමු. තම ආරක්ෂාව සහන් සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරවීම ආරම්භ කරමු.

**මේ සඳහා අප්‍රමාන්ව ම සමුපකාරිකයන්බලමුළු ගන්වමින්ජන බලය ගොඩනගමු.න් නිසි අන්කරණ ක්‍රියාමාර්ග වෙත යොමු වෙමු.**